INTRODUCING 1st TIME IN UK

FareDeals Travel & Tours
Fly With Someone You Trust
458, Alexandra Avenue, Rayner's Lane, (Opp:Tube). HA2 9TL. United Kingdom.

- All Deals Available in Colombo Market ( In Rupees)
- Cheaper than Leading Agents in Colombo
- We deliver Tickets to your Door Step in Sri Lanka
- No Middlemen, Book Directly With us in London

Fly to Colombo

| | |
|---|---|
| Srilankan Air | £ 260* |
| Qatar Air | £ 260* |
| Kuwait Air | £ 220* |
| Oman Air | £ 190* |
| Ethihad Air | £ 350* |
| Jet Air | £ 280* |
| Gulf Air | £ 210* |

Buy your COLOMBO to LONDON/ UK, Australia, Italy, USA, Tickets. pay in pounds or rupees.

Call Dulip or Sidath
0208 150 9183
0800 612 4045

Fly to London / UK

| | |
|---|---|
| Srilankan | Rs. 85000* |
| Qatar | Rs. 62000* |
| Kuwait | Rs. 56000* |
| Royal Jor | Rs. 58000* |

Special Student Offers (o/way)

| | |
|---|---|
| Srilankan | Rs. 50000* |
| Qatar | Rs. 58000* |
| Kuwait | Rs. 41200* |

* Fares subject to taxes/change

Emergency Travel ctc Dulip
07551 549 559
info@faredealtravels.co.uk
www.faredealtravels.co.uk

ETIHAD Emirates CATHAY PACIFIC KUWAIT AIRWAYS SriLankan QATAR AIRWAYS


# ජෙනරාල් ෆොන්සේකාගේ තනියට මදුරුවෝ - රනිල්

වැලිකඩ බන්ධනාගාරයේ සිරකර සිටින හිටපු හමුදාපති සරත් පොන්සේකා මහතාගේ සුවදුක් බැලීමට විපක්ෂ නායක හා එක්සත් ජාතික පක්ෂ නායකයා වන රනිල් වික්‍රමසිංහ මහතා ගිය සතියේ ගියේය.

බන්ධනාගාරයෙන් පිටතදී වික්‍රමසිංහ මහතා මාධ්‍යවේදීන් සමග පැවසුයේ කලින් වතාවේ තමා දුටු පහසුකම් එහි අද නොදුටු බවය.

" යුද වීරයකු වූ පොන්සේකාගේ තනියට අද ඉන්නේ මදුරුවන් පමණයි....... දේශපාලන සිර කරුවෙකුට ලැබෙන පහසුකම්වත් ඔහුට නැහැ....... ඔහුට උදේ තේ කෝප්පයක්වත් නොලැබෙන බව මට කීවා......" යයි කී රනිල් වික්‍රමසිංහ මහතා ඔහු බේරා ගැනීමේ සටන ඉදිරියට ගෙනයන බවද මාධ්‍යයට පවසා ඇත. එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක කරු ජයසූරිය සහ මහලේකම් තිස්ස අත්තනායක යන මහත්වරු ද එදින ජෙනරාල් බැලීමට ගියහ.

# ජෙනරාල්ට අපි සලකනවා - හිරගෙදරින් කියයි

බන්ධනාගාරගතව සිටින ජෙනරාල් ෆොන්සේකාට නීතිය මගින් දක්වා ඇති පරිදි සෑම සිර කරුවෙකුටම හිමිවිය යුතු ප්‍රමාණයට අවශ්‍ය හැම පහසුකමක්ම නොඅඩුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් සපයනු ලැබ ඇති බව බන්ධනාගාර ප්‍රකාශක කෙනත් ප්‍රනාන්දු මහතා පවසයි. ජෙනරාල්වරයාට අඩු සැලකිලි දක්වන වායයි සමහර පුද්ගලයින් සහ පුවත් අඩවි පළකරන තොරතුරු අසත්‍ය බවත්, ඔවුන් එසේ කරනවා ඇත්තේ සාමාන්‍ය මහජනතාව තුළ වැරදි හැඟීමක් ඇතිකරන ලෙසින් වියයුතු බවත් ඔහු පවසයි. එසේම සැලකිලි සම්බන්ධයෙන් ජෙනරාල්වරයාගෙන් මෙතෙක් කිසිදු පැමිණිල්ලක් ලැබී නැති බවද ඔහු අවධාරණය කරයි.

# මාලු පාන් පාසලෙන් සමුගනී

ලංකාවේ සියලුම පාසල් ආපන ශාලාවලින් කෘත්‍රිම සහ ක්ෂණික ආහාර ඉවත් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය නව නීතියක් පනවා තිබේ. ඒ අනුව බෙහෝ කලක් පාසල් කැන්ටින් එකේ වාසය කළ මාළු පාන්, බිත්තර පාන්, පේස්ට්‍රි, කට්ලට්, පැටිස් කැන්ටිම හැරදා යන අතර ඒ වෙනුවට මුං ඇට,කඩල,කව්පි,බත් හා පළතුරු පැමිණෙනු ඇත.

♦ *කේ. එල්. කරුණාරත්න* Sri Lanka

# ♥ පැටියො ඩාලිං



" පැටියො දන්නවද? අන්න ලංකාවෙ මන්ත්‍රීලා සේරම දැන් සිංදු කියන්න පටන් අරගෙන.... ඒ සේරටම ගායකයො වෙන්න ඕන වෙලා....එහේ ටෙලිවිෂන් එකේ හැමදාම ඒ බජව් පෙන්නනවා.... "

" ඔව්! ඒ අය හොඳ ගායකයො තමයි..... අපේ රටේ මිනිස්සු කවදත් කළේ කරබාගෙන ඒ කියන සිංදු අහන් හිටපු එක තමයි...ඉදිරියටත් ඉතින් එහෙමයි."


FareDeals SpeedCash

Money Transfer to Sri Lanka
0208 150 3343

Quick & Reliable Service, Guaranteed

We Offer you:
Competitive Exchange Rates
Affordable Charges from 5 Pounds
Transfer within 24Hrs or 48Hrs in Sri Lanka
A Money Services Business Registered in the UK
No Commission or Handling Charges In Sri Lanka
A Business with a New Name & Management

Visit us Today & Register

Main Branch:-
458,Alexandra Ave,
Rayner's Lane,
(Opp. Tube Station)
Middx. HA2 9TN

Coming Soon!! New Branches..
info@fdspeedcash.co.uk
www.fdspeedcash.co.uk

FAREDEALS SPEEDCASH IS A MSB / MLR REGISTERED BUSINESS WITH HM CUSTOMS AND EXCISE NO.12600779


# Sinhala Lesson 15 සිංහළ පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

පහත දැක්වෙන සිංහල අකුරු ශබ්දකරන්නේ ඊට යටින් ඇති ඉංග්‍රිසි වචනයේ ඉරිගසා ඇති කොටස හඬ නැගෙන විධියට බව දරුවන්ට කියා දෙන්න.

The sound of each Sinhala letter corresponds to the underlined part of the English word. Now read aloud the Sinhala letter.

## Vowel Strokes

ා ැ ෑ ි ී ු ූ ෘ ෲ
ෙ ේ ෛ ො ෝ ්

| | | | | |
|---|---|---|---|---|
| ර | රා | රැ | රෑ | |
| rub / mirror | rather | rat | ran | |
| රි | රී | රු | රූ | රෙ |
| rim | read | rook | room | red |
| රේ | රො | රෝ | ර් | |
| ray | rod | rode | purr | |

♦ ආචාර්ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

# හරස්පද ප්‍රහේලිකා 122

**හරහට :**
1 කුඩා කරත්ත
5 බඩගින්න 6 දැඩි
7 පෙළපත් නාමයක්
9 කොට නැති
11 ආදර්ශ පාඨ

**පහළට :**
1 බෞද්ධයෙකු වීමට නම් මෙය අවශ්‍යමය
2 යාර බාගයක දිග
3 නොදැන ගියොත් අතරමං
4 අත් වූ.
8 මහ පාර 10 බෙලෙක්ක මෙසේද හැඳින්වේ

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | | 3 | 4 |
| 5 | | ■ | 6 | |
| 7 | | 8 | | ■ |
| | ■ | 9 | | 10 |
| 11 | | | | |

***ගියවර නිවැරදි විසඳුම්***

**හරහට :** 1 විදුරුමහ 5 සල 6 ලප 7 කබරයා 9 තුසිත 11 වඳවීයාම
**පහලට :** 1 විසකටුව 2 දුලබ 3 මලයාසියා 4 හප 8 රතුවී 10 තම

# නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

## කිරි ටොෆි Milk Toffee

***අවශ්‍ය ද්‍රව්‍ය :***

| | |
|---|---|
| ටින් කිරි ( උකු වර්ගයේ ) ටින් | 1 යි |
| සීනි ග්‍රෑම් | 350 යි |
| වැනිලා තේ හැඳි | 1 යි |
| වතුර කුඩා කෝප්ප | 1 යි |
| කරදමුංගු කරල් | 2 යි |
| කජු ග්‍රෑම් | 50 යි |

***සාදන ක්‍රමය :*** කජු රන්වන් පැහැයට එනතුරු බැදගන්න. එය අවශ්‍ය නම් මයික්‍රෝවේව් එකකින්ද කරගත හැකිය. තත්පර **45** ක් මධ්‍යම ප්‍රමාණයට බැද නවතා නිවෙන්නට තත්පර **30** ක් පමණ තබා එය නැවත තත්පර **45** ක් මයික්‍රෝවේව් කරන්න. කජු නිවුණාට පසු කුඩා කැබලි වලට කපාගන්න. කරදමුංගු ද ඉතා සිහින්ව කුඩා වංගෙඩියක දමා තලා කුඩුකර ගන්න. පසෙකින් තබන්න.

පැතලි දීසියක් ගෙන එහි බටර් ටිකක් තුනීවට තවරාගන්න. පතුල නොඇලෙන ගැඹුරු සාස්පානකට සීනි දමා ඊට වතුර ප්‍රමාණය එක්කර මනාව කළවම් කරන්න. එය ලිප තබා රත්වුණු පසු එම සීනි මිශ්‍රණයට ටින් කිරි කඩා වත්කරන්න. නොනවත්වා විනාඩි **15** ක් පමණ හැඳිගාන්න. වැනිලා සහ කරදමුංගු එක්කර කළවම් කරන්න. මිශ්‍රණය රන්වන් පැහැයෙන් ඝන වෙිගන එනවිට එයට කජු කැබලි එකතුකරන්න.

දැන් ඒ උකු මිශ්‍රණය කලින් පිළියෙල කළ පැතලි දීසියට වත්කර හැන්දකින් තලා සමතලා කරගන්න. නිවෙන්නට හැර නිවීගෙන එනවිට පිහියකින් හතරැස් කුඩා කැබලිවලට කපාගන්න. පිහිය නොඇලෙන්නට වරින් වර තෙත රෙදිකඩකින් පිහිතලය පිසදාන්න.

♥ ***ලක්මලී රත්මල්ගම*** Warwickshire UK


Sam's CHICKEN CHICKEN CHICKEN
Great Tasting! Great Value!
සැම්ස් චිකන්
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432